# මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි පුරාණ විහාරයේ බිතුසිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

ටී.එස්.ඩී. තිලකරත්න

රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර.
dilshansha321@gmail.com

**මුඛ්‍ය පද** - ආවේණික, කලා ශිල්ප, මාධ්‍ය, සම්ප්‍රදාය, සිතුවම්

## හැඳින්වීම

ඉපැරණි සමුද්‍රගිරි විහාරයීය බිතුසිතුවම් අතුරින් විශේෂ සිතුවම් කලාව විග්‍රහ කිරීම මෙහි දී අපේක්ෂා කර ඇත. සමුද්‍රගිරි විහාරයේ පිහිටීම, සිතුවම් සඳහා යොදාගත් ආකෘතිය මෙන්ම මෙම සිතුවම් චිත්‍රණය කිරීමේ දී මහනුවර යුගයෙන් ලද ආභාසය, සමකාලීන පහතරට සමාජයෙන් වූ බලපෑම් මෙන්ම යුරෝපීය ආභාසය සිතුවම් තුළට ඇතුලු වී ඇති ආකාරය ආදී සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක තත්ත්වයන් රැසක් විවරණය කිරීමට මෙහි දී අපේක්ෂා කරනු ලබයි.

සමුද්‍රගිරි විහාරයේ සිතුවම් 1880 දශකයට සම්බන්ධ කළ හැකි ය. මෙහි යොදා ඇති වර්ණ පද්ධතිය දහනව වන සියවසේ සිතුවම්වල සුලබව දක්නට ලැබෙන වර්ණයන්ට සමාන වේ. ඒවා සාමාන්‍යයෙන් ඉතා දීප්තිමත් ය. ඉතා පුළුල් වර්ණ පද්ධතියක් භාවිතා කර ඇත. නමුත් පසුබිම සාමාන්‍යයෙන් තද රතු පැහැයෙන් දැක්වෙන අතර ගොඩනැගිලි අභ්‍යන්තරය නිතරම අඳුරුව හෝ රතු පැහැයෙන් දැක්වේ. පුද්ගලයින්ගේ ඇඳුම් සඳහා මූලික වශයෙන් සුදු භාවිතා කළ ද, රතු හෝ කොළ නිල් ආදී අලංකාර මෝස්තර සහ ඇඳුම්වලට විශාල පුල්ලි වශයෙන් දුඹුරු පාට සහ අඳුරු කහ පාටක් ද ඇතැම් විට යොදා ගැනේ. මල්, කොළ සහ සතුන් ඇඳීමේදී ද, මිනිස් රූපවල මුහුණු රේඛාවල ද, ගෘහ නිර්මාණය සම්බන්ධ රේඛාවල ද ඉතා සුළු සුළු වශයෙන් අඳුරු කිරීමක් නිතරම මෙහි දක්නට ලැබේ.

බිතුසිතුවම් හරහා පහත රට සමාජයේ එවකට තිබූ සමාජ, ආගමික, දේශපාලනික වෙනස්වීම් මෙන්ම දේශීය, විදේශීය ආභාසය මත කලාව ප්‍රවර්ධනයටත් යම් යම් වෙනස්වීම්වලට ලක් වූ ආකාරයන් මැනවින් නිරූපණය කර ඇත. මෙකී ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස කලාව වර්ධනය වූවා සේම පාරම්පරිකව කලාකරුවන් සිය සිතුවම් හා මූර්ති, සැරසිලි, මෝස්තර යොදා ගනු ඇත. කලාකරුවන් සැරසිලි මෝස්තර සඳහා බහුලව සත්ත්ව රූප හා මල් සැරසිලි යොදා ඇත්තේ එතුළින් රසවින්දනයක් මෙන් ම අර්ථයක් ලබා දීම කලාකරුවන්ගේ අභිමතාර්ථය බවට පත්වී ඇති බව මෙම සිතුවම් හරහා විද්‍යමාන වේ.

## ක්‍රමවේදය

මිරිස්ස වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ බිතුසිතුවම් පහතරට චිත්‍ර සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකිය හැකිය. මාතර දිස්ත්‍රික්කයේ විහාරාරාම අතර වැඩි ම සිතුවම් සංඛ්‍යාවක් සහිත පුදබිම වෙහෙරගල්ලයි. වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ බිතුසිතුවම් කොටස් හතරකට බෙදා හඳුනා ගත හැකිය. එනම් බුද්ධ චරිතය, ජාතක කතා, දෙවිවරුන් සහ රාශි නැකත් වශයෙනි. විහාර මන්දිරයේ 18 රියන් සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේගේ හිරස්පතට ඉහළින් සූර්යයාත් සිරිපතුලට ඉහළින් චන්ද්‍රයාත් සටහන් කොට ඇත. එවැනි සිතුවම් මාතර දිසාවේ වෙනත් විහාරස්ථානයක දක්නට නොලැබේ. එසේම අසූ මහා ශ්‍රාවකයන් වහන්සේගේ නම් සහිතව සිතුවම් තිබීම ද වෙනත් විහාරස්ථානයක නොමැති ලක්ෂණයක් විද්‍යමාන කරවන්නකි. පියපත් මෝස්තරයකින් සිතුවම් කොට තිබෙන සිවිලිම ද ඉතා දර්ශනීය වූවකි. විහාරස්ථානය තුළට පිවිසීම සඳහා මකර තොරණ සහිත උළුවහු තුනක් වෙයි. එම උළුවහුවලට ඉහලින් සිතුවම් තුනක් නිර්මාණය කොට ඒ පිළිබඳ කෙටි වැකි ද ලියා ඇත. වෙහෙරගල්ල විහාරයේ බිතුසිතුවම් අඛණ්ඩ කථන ක්‍රමය හෙවත් එක දිගටම දෙපස ඇඳ තිබේ. වෙහෙරගල්ලේ සිතුවම්වල දක්නට ඇති තවත් විශේෂ

ලක්ෂණයක් වෙයි. බුදුන් වහන්සේ පන්සාළිස් වස් විසූ ස්ථාන නම් සමඟ සිතුවම් කොට ඇත. බුදු සිරිත ආදාහනයෙන් කෙළවර වන තෙක් ද මෙහි සිතුවම් කොට තිබේ. රාශි 12 සහ නැකැත් 27 නිරූපිත චිත්‍ර මෙහි විශේෂත්වයක් වන්නේ සෙසු විහාරස්ථානවල දී ඒවා හසු නොවන බැවිනි. ඒ අනුව ක්ෂේත්‍ර අධ්‍යයනයක් සහ ද්විතීයික දත්ත උපයෝගී කරගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

19 වන සියවසෙහි නිර්මාණය වූ පහතරට වෙරළබඩ කලාපීය සිතුවම් අතරට අයත් වන මිරිස්ස සමුද්‍රගිරි විහාරයෙහි දක්නට ලැබෙන සිතුවම් කලාවෙන් එහා ගොස් තත්කාලීන සමාජ ක්‍රමය ප්‍රබල ලෙස විවරණය කරන්නා වූ සිතුවම් ප්‍රකාශනයක් ලෙස හඳුනා ගත හැක. මහනුවර සිතුවම් කලාවේ බලපෑමත්, පහතරට සමාජ ක්‍රමයෙහි බලපෑම සහ සියවස් ගණනාවක් මුළුල්ලේ වෙරළබඩ කලාපය පුරා පැවති බටහිර අධිරාජ්‍යවාදී පාලන ක්‍රමය තුළින් ආරෝපිත වූ තත්ත්වයන් සහ බටහිරකරණයෙහි බලපෑම නිරායාසයෙන් ම සිතුවම්කරණයේ දී චිත්‍රණය වී ඇති ආකාරය සමාජ විද්‍යාත්මකව සහ මානව විද්‍යාත්මකව මෙම සිතුවම් සියුම්ව විග්‍රහ කිරීමේ දී හඳුනා ගත හැකි වේ. සමස්ථ සිතුවමෙහි පසුබිම මහනුවර චිත්‍රකරණයේ දී බහුලව යොදා ගත් රතු පැහැය යොදා ගනිමින් සිතුවම් කර ඇත. එමෙන් ම සිතුවම් පුරා දක්නට ඇති මිනිස් රූප චිත්‍රණයේ දී පාද පාර්ශව දර්ශීව සිතුවම් කර ඇති අතර එය ද මහනුවර චිත්‍ර සම්ප්‍රදායේ දක්නට ඇති එක් සුවිශේෂී සිතුවම්කරණයෙහි ලක්ෂණ වන අතර එමඟින් සිතුවම පුරා මිනිස් රූපවලට සජීවී බවක් ආරෝපණය කර ඇති අතර මිනිසුන් ගමන්ගන්නා දිශානතියක් එතුළින් හඳුනා ගත හැක.

සමකාලීන සමාජ ක්‍රමයෙහි ඇති කුල ධූරාවලි තත්ත්වය පිළිබඳ බැලීමේ දී චිත්‍රකරණයේ දී එක් එක් මිනිස් රූප සඳහා යොදා ඇති වස්ත්‍ර අනුව එය හඳුනා ගත හැකි වේ. සිතුවම් වර්ණ සුසංයෝගය පිළිබඳ බැලීමේ දී ද සමකාලීන සමාජයෙහි පැවති කුල ධූරාවලිගත තත්ත්වය මෙන්ම වාර්ගික අදහස් වැනි දේ පිළිබඳ හඳුනාගත හැක.

මිනිස් රූපවල ද සපත්තු පැළඳ සිටින ආකාරය දැක ගත හැකි අතර රජු පැළඳගෙන සිටින ඔටුන්න ද යුරෝපීය ආභාසය ගනු ලබයි. එමෙන් ම ඇතැම් වස්ත්‍ර විචිත්‍රවත් යුරෝපීය වස්ත්‍ර ලෙස හඳුනා ගත හැකි අතර මෙහි දී එකල සමාජය යුරෝපීයකරණයට කොතෙක් දුරට ග්‍රහණය වී ඇති ද යන්න මෙහි දී හඳුනා ගත හැකි වේ. ඇඳුම් පැළඳුම්වලට අමතරව බටහිර සම්ප්‍රදායට අයත් ගෘහ භාණ්ඩ මෙන්ම බොහෝ ගොඩනැගිලි ද බටහිර ආභාසය සහිත ඒවා විය.

චිත්‍රණය කර ඇති බොහෝ සිතුවම් හරහා මහනුවර යුගයෙන් ලද ආභාසය, සමකාලීන දකුණුදිග පහතරට සමාජය හරහා කළ බලපෑම් මෙන්ම එවකට යුරෝපීය බලපෑම ද මනාව ප්‍රකට වනු ලබයි. විහාරස්ථව චිත්‍රණය කොට ඇති බිතුසිතුවම්හි ගැබ්ව ඇති සමාජයීය හා මානව විද්‍යාත්මක ලක්ෂණ, මහනුවර යුගය හා සමකාලීන පහතරට සමාජය මෙන්ම යුරෝපීය බලපෑම සිතුවම්කරණයට මුල්බැසගෙන ඇති ආකාරය මෙහි දී උද්දීපනය වේ. අවසාන වශයෙන් සමුද්‍රගිරි විහාරයීය බිතුසිතුවම් මෙරට සිතුවම්කරණයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරන බව පෙන්වා දීම සාවද්‍යය නොවන බව පැහැදිලිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

රත්නායක, දර්ශන. (2009). ***මහනුවර චිත්‍ර සම්ප්‍රදාය හා සමාජය.*** එල්ලක්කල: සුරම්‍ය ප්‍රකාශන.

සෝමතිලක, එම්. (2002). ***මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ සිතුවම් සම්ප්‍රදාය.*** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

හේවාපතිරණ, දයා. (2012). ***ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව.*** බෞද්ධ සංස්තික මධ්‍යස්ථානය.